# පොකුණුවිට රජමහා විහාරයේ සීමාමාලකය සංරක්ෂණය සඳහා ස්මාරක සංරක්ෂණ මූලධර්ම හා විධිනියම යොදා ගෙන තිබෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ඒ.ඩී.පී. තිමාලි

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
pushpathimali93@gmail.com

ප්‍රමුඛ පද- ස්මාරක සංරක්ෂණය, පොකුණුවිට රජමහා විහාරය, සංරක්ෂණ මූලධර්ම

## හැඳින්වීම

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පොකුණුවිට නම් ග්‍රාමයේ පොකුණුවිට රජමහා විහාරයට අයත් පොහොය ගෙය පිහිටා තිබේ. කොළඹ සිට හොරණ ප්‍රධාන මාර්ගයේ පැමිණ පොකුණුවිට මංසන්ධියේ සිට මඳ දුරක් ඉදිරියට ගොස් වමට හැරීමට ඇති අතුරු මාර්ගයේ මීටර් 200ක් පමණ ගමන් කළ විට පොකුණුවිට රජමහා විහාරයට ළඟා විය හැකිය. ඓතිහාසික වශයෙන් ගත් කල මෙම විහාරස්ථානයේ ආරම්භය සම්බන්ධයෙන් නිශ්චිත සාධක නොමැති වුව ද ක්‍රි.ව 4 වැනි සියවස පමණ වන විටත් මෙම සිද්ධස්ථානය පැවති බවට එහි ඇති ශිලා ලේඛනයක් තුළින් අනාවරණය වේ. එහි දේව නැමැති අමාත්‍යවරයෙකු විසින් කිර්ති ශ්‍රී මේඝවර්ණ (ක්‍රි.ව. 301-328) රාජ්‍ය සමයේ මෙම ස්ථානයට කරන ලද ප්‍රදානයක් පිළිබඳ තොරතුරු එහි සඳහන් වේ. පොකුණුවිට විහාරස්ථානයේ පෞරාණිකත්වය පිළිබිඹු කරනු ලබන ප්‍රධාන සාධකයක් ලෙස එහි දක්නට ලැබෙන දෙමහල් සීමාමාලකය හඳුනාගත හැකිය. අනතුරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2007.01.01 දින මෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කර ඇති අතර 2008.12.31 දින එම කටයුතු අවසන් කර තිබේ. එම අවස්ථාව වන විටත් පොහොය ගෙය වහලයේ වූ දැව රාමුව දිරාපත් වීම හා ආරුක්කු හා බිත්ති පුපුරා කඩා වැටීමට ආසන්නව තිබී ඇති අතර මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය තුළින් දිරාපත් වී පැවති වහල හා බිත්ති සංරක්ෂණය සිදුකර ඇත. මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය තුළ සංරක්ෂණ මූලධර්ම හා විධිනියම භාවිත කර ඇති ආකාරය පිළිබඳ ව විමසීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයෙ සිදු කිරීමේ දී ප්‍රධාන වශයෙන් තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබුයේ පොකුණුවිට රජමහා විහාරයේ සීමාමාලකය සංරක්ෂණය පිළිබඳ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු වාර්තාව හා සංරක්ෂණ මූලධර්ම හා විධිනියම සම්බන්ධයෙන් වන ග්‍රන්ථ, ප්‍රඥප්ති වැනි මූලාශ්‍ර පරිහරණය සිදු කරන ලදී. තවදුරටත් කරුණු රැස් කිරීම සඳහා ක්ෂේත්‍රය තුළ ගවේෂණය කිරීම ද සිදු කරනු ලැබූ අතර ඒ මගින් සීමාමාලකයේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. මෙලෙස රැස් කරගන්නා ලද තොරතුරු සන්සන්දනාත්මක ව හා විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය තුළින් පොකුණුවිට විහාරස්ථානයේ සීමාමාලකය සංරක්ෂණය සඳහා සංරක්ෂණ මූලධර්ම හා විධිනියම භාවිත කර ඇති ආකාරය හඳුනාගැනීම සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පොකුණුවිට රජමහා විහාරස්ථානයේ සීමාමාලකය සංරක්ෂණය කිරීමේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන්නට යෙදුනු ව්‍යාපෘතිය තුළ සංරක්ෂණ මූලධර්ම හා විධිනියම යොදාගනු ලැබ ඇති ආකාරය පිළිබඳ විමසීමේ දී ස්මාරකය දිරාපත් වීමට හේතු අනාවරණය කරගැනීම, ස්මාරකයේ අගයන් හඳුනාගැනීම, මැදිහත්වීමට පෙර සුදානම් වූ ආකාරය, මැදිහත්වීමේ මට්ටම හා ස්මාරකයේ සත්‍යතාවය ආරක්ෂා කර ඇති ආකාරය යන අංශ පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදුකරන ලදි.

සංරක්ෂණ මූලධර්ම අනුව යමින් මෙම ස්මාරකය දිරාපත්වීම කෙරෙහි බලපාන ලද සාධක හඳුනාගැනීම ව්‍යාපෘතිය ආරම්භයට පෙර සිදුකර ඇති අතර එම සාධක ප්‍රධාන අංශ 3 ක් යටතේ වර්ගීකරණය කළ හැකි ය. ඒ අනුව ඉදිකිරීමේ ව්‍යුහාත්මක නිර්මාණයේ දුර්වලතාවයන් ස්මාරකය දිරාපත් වීම කෙරෙහි සිදු කර තිබෙන බලපෑම ඉතා අවම මට්ටමක පැවතිය ද හිරු එළිය, වැස්ස, පින්න, කෘමීන්ගෙන් වූ හානිය හා විවිධ ශාක වර්ග වැනි ස්වභාවික හේතූන් නිසාවෙන් ස්මාරකයට බෙහෙවින් හානි සිදු වී ඇත. එමෙන් ම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් දැව ස්වරූපය වෙනස්වීම යන කරුණු ද මෙම ස්මාරකයේ දිරාපත් වීමට හේතු වී තිබේ.

මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත් ආකාරයට පොකුණුවිට සීමාමාලකය තුළින් විදහා දක්වනු ලබන අගයන් වන වාස්තු විද්‍යාත්මක, ඓතිහාසික, පුරාවිද්‍යාත්මක අධ්‍යාත්මික හා සංකේතාත්මක, තාක්ෂණික හා විද්‍යාත්මක හා භාවිතමය යන අගයන් ආරක්ෂා කර ගනිමින් සංරක්ෂණය සිදුකර තිබේ.

යම්කිසි පුරාවිද්‍යා කටයුත්තක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා මනා පූර්ව සුදානමක් පැවතිය යුතු ය යන සංරක්ෂණ මූලධර්මය අනුගමනය කරමින් පොකුණුවිට සීමාමාලකය සංරක්ෂණ ව්‍යාපෘතියේ දී අවශ්‍ය කරනු ලබන ලේඛන කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබ තිබේ.

ස්මාරකයට අදාළ වන මැදිහත්වීමේ මට්ටම තීරණය කිරීමේ දී මෙම ස්මාරකය අයත් දේශගුණික තත්වය හා සමාරකයේ වර්තමාන ස්වභාවය පිළිබඳ සැලකිලිමත් වී ඇත. ඒ අනුව ප්‍රතිසංස්කරණ මට්ටමේ මැදිහත්වීමක් පොකුණුවිට සීමාමාලකය සම්බන්ධයෙන් අනුගමනය කර ඇති බව හඳුනාගත හැකි විය. ඒ යටතේ පොහොය ගෙයි ඉහළ මාලයේ පිටත කැටයම් සහිත ජනෙල් පියන් සෑදීම හා ඒවායේ තීන්ත ආලේප කිරීම, පැරණි තරප්පුවේ දිරාපත් වී තිබූ කොටස් නැවත සකසා අලුතින් යෙදීම හා තීන්ත ආලේප කිරීම සිදුකර ඇත. එමෙන් ම බිත්තිවල වූ කැටයම් හා මල්මොස්තර සහිත කපරාරු කොටස් ගැලවී ගොස් තිබූ නිසාවෙන් ඒවා නැවත සකසා හුණු ආලේප කිරීම හා ඉදිරිපස හා පිටුපස කයිරුව හා පඩිපෙළ සකස් කර රතු සිමෙන්තියෙන් මැදීම ද කර තිබේ. වර්තමානය වන විට මෙම සීමාමාලකය කෞතුකාගාරයක් වශයෙන් ද භාවිත කරනු ලබන බැවින් පුනරුත්ථාපනය යන මැදිහත්වීමේ මට්ටම ද සිදුකර ඇති බව හඳුනාගත හැකි විය. තවදුරටත් විමසීමේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා විහාරාධිකාරිය එක් වී මෙම ස්මාරකය දිරාපත් වීම සඳහා ක්‍රියාකාරී වන ක්‍රියාවලින්ගෙන් ආරක්ෂා කර ගැනීම අරමුණු කර ගනිමින් අඛණ්ඩ නඩත්තු ක්‍රියාවලියක් පවත්වාගෙන යනු ලබන බැවින් දිරාපත් වීම විකෘතිවීම වැළැක්වීම යන මැදිහත්වීමේ මට්ටම ද අනුගමනය කරනු ලබන බව අනාවරණය විය. පොකුණුවිට සීමාමාලකය

සංරක්ෂණයේ දී එහි සත්‍යතාවය ආරක්ෂා කිරීම සංරක්ෂණ මූලධර්ම අනුව යමින් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් විමසීමේ දී ස්මාරකයේ සැලැස්මේ සත්‍යතාවය රැකගැනීමට එහි සැලැස්මට දායක වී ඇති ද්‍රව්‍ය හා අනු කොටස් සියල්ල ආරක්ෂා කිරීමට කටයුතු කර ඇති අතර විනාශ වී ගිය කොටස් නැවත ඉදිකිරීම මඟින් ස්මාරකයේ සැලැස්ම ඉස්මතු කර ඇත. එමෙන්ම ස්මාරකයට හානිකර, නුසුදුසු ඉදිකිරීම් ඉවත් කිරීමට ද පියවර ගෙන තිබේ. මෙම ස්මාරකයේ ද්‍රව්‍ය වල සත්‍යතාවය ආරක්ෂා කර ගැනීම සඳහා මුල් ද්‍රව්‍ය බොහෝමයක් ආරක්ෂා කිරීම, මුල් ද්‍රව්‍ය ඉවත් කිරීමේදී එම ද්‍රව්‍ය වල පැහැයට, හැඩයට සැම ලෙසින්ම සමාන බදාම කපරාරුව යෙදීම යන පියවර ගෙන තිබේ. නමුත් ජනේල වර්ණ ගැන්වීමේ දී මුල් පැහැයට පටහැනිව යමින් වර්ණ ගැන්වීම් සිදුකර ඇති බව මෙම අධ්‍යයනය තුළ දී අනාවරණය විය. පොහොය ගෙයි නිම කර ඇති කොටස් පෙර පරිදි ආරක්ෂාකර ගැනීමත්, අලුතින් එකතු කරන ලද කොටස් මුලින් නිම කර තිබූ පරිද්දෙන්ම සකස්කර ගැනීම තුළින් නිමාව පිළිබඳ සත්‍යතාව ආරක්ෂාකර ගැනීමට කටයුතු කර තිබේ. භෞතික හා භෞතික නොවන පරිසරය සමඟ ඇති සබඳතාවය හෙවත් වටාපිටාව පිළිබඳ සත්‍යතාවය සම්බන්ධයෙන් ද මෙහි දී ආරක්ෂා කිරීමට කටයුතු කර ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල නූතන සංරක්ෂණ මූලධර්ම හා විධිනියම නිසියාකාරව අනුගමනය කරමින් මෙහෙයවන ලද සංරක්ෂණ ව්‍යාපෘතියක් ලෙස පොකුණුවිට රජමහා විහාරයේ සීමාමාලකය සංරක්ෂණය නම් කළ හැකි බව මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය.

### ආශ්‍රිත ග්‍රන්ථ


දේවිකා, පී. ඒ. එම්. (2008) ***පොකුණුවිට රජමහා විහාරය සීමාමාලකය,*** සංරක්ෂණ වාර්තාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

BETZET, H. (2009) ***International Principles of Preservation.*** ICOMOS